චක්‍ර ලේඛ අංක 10/95

මගේ අංකය: සිං/ සේවක/ චක්‍ර
සමුපකාර සේවක කොමිෂන් සභාව (බ.ප.)
03 වන මහල,
මහලේකම් කාර්යාලය,
කොළඹ 10.
1995 ජූනි මස 1 දින.

බස්නාහිර පළාතේ සියලුම සමුපකාර සමිති
සභාපතිවරුන් වෙත

මහත්මයාණෙනි,

වැඩ තහනමට ලක්වූ සේවකයන්ගේ වැටුප් පිළිබඳ කොට
වෙන්කර තැබීම.

කිසියම් විෂමාචාරයක් හේතුකොට ගෙන වැඩ තහනමට ලක්වූ සමුපකාර සේවකයන්ට වැටුප් හා දීමනා නොගෙවන අවස්ථාවලදී ඔවුන්ට හිමිවිය යුතු වැටුප් හා දීමනා නිසි පරිදි පිළියෙල කොට වෙන්කර නො තැබීමේ හේතුවෙන් සමුපකාර සමිතිවලට නොයෙකුත් දුෂ්කරතාවලට මුහුණපෑමට සිදුව ඇත. සමහර අවස්ථාවන්හිදී විනයානුකූල ක්‍රියාමාර්ගයකින් පසු හිග වැටුප් සියල්ල සේවකයන්ට එකවර ගෙවීමට සිදුවීම නිසා මේ තත්ත්වය උග්‍ර වී තිබේ.

02. වැඩ තහනම් කිරීමක් සමග සේවකයකු සමිතියේ සේවය සඳහා වාර්තා නොකළත් ඔහු සමිතියේ අනුමත කාර්ය මණ්ඩලයේ සිටින සේවකයකු ලෙස අවසාන නොකළයුතු වේ. බොහෝ අවස්ථාවන්හිදී වැඩ තහනම් කරන ලද සේවකයන් විනයානුකූල ක්‍රියා මාර්ගයෙන් පසු හෝ අභියාචනා ක්‍රියා මාර්ගයෙන් පසු හෝ යළිත් සේවයේ පිහිටුවීමට ඉඩ ඇත. එම නිසා ඔවුන්ට හිමිවිය යුතු වැටුප්, දීමනා පමණක් නොව වැටුප් වර්ධක පවා දීමට සිදුවන අවස්ථා වළදී. එහෙයින් කිසියම් සේවකයකුගේ වැඩ තහනම් කිරීමක් සමග ඔහුට හිමිවිය යුතු වැටුප් හා දීමනා, (සේවයේ යෙදී සිටින සේවකයකු සේ සලකා) නියමිත පරිදි පිළියෙල කොට වෙනම ගිණුමක තැන්පත් කර තැබිය යුතු වේ.

03. ඔබ සමිතියේ දැනට වැඩ තහනමට ලක්වී සිටින සේවකයින්ට නියමිත පරිදි ගෙවිය යුතු වැටුප් හා දීමනා නිසි පරිදි ගණනය කර වෙනම ගිණුමක තැන්පත් කර ඇති බව ඒ පිළිබඳ මා වෙත වාර්තා කරන්න. අනිකුත් සේවකයන්ට මාසිකව වැටුප් ගෙවන්නාසේම වැඩ තහනමට ලක් වූ සේවකයන්ට ද ගෙවිය යුතු වැටුප් මාසිකව එම ගිණුමට බැර කළයුතු වේ.

04. මේ අන්දමින් ක්‍රියා කිරීමෙන් කිසියම් දිනක වැඩ තහනමට ලක්වූ සේවකයෙකුට හිඟ වැටුප් හා දීමනා ගෙවීමට සිදුවුව ද මුදල් වෙන්කර ඇති බැවින් සමිතියට මූල්‍ය දුෂ්කරතා වලට මුහුණ පෑමට සිදු නොවනු ඇත. එහෙයින් සෑම සමිතියක් විසින්ම මෙම උපදෙස් තදින් පිළිපැදිය යුතු බැව් අවධාරණයෙන් දැනුම් දෙමි.

මෙයට - විශ්වාසී වූ
කොමිෂන් සභාවේ නියෝග පරිදි,

(පී.ඩී. චන්ද්‍රදාස)
ලේකම්
සමුපකාර සේවක කොමිෂන් සභාව.

පී. ඩී. චන්ද්‍රදාස
ලේකම්
සමුපකාර සේවක කොමිෂන් සභාව (බ.ප.)
මහලේකම් කාර්යාලය
කොළඹ 10

පිටපත්:-
1. ප්‍රධාන ලේකම්, බස්නාහිර පළාත
2. ලේකම්, කෘෂිකර්ම, ප.පා. සහ සමුපකාර අමාත්‍යාංශය (බ.ප.) - දැ.ගැ.
3. සමුපකාර සංවර්ධන කොමසාරිස් හා රෙජිස්ට්‍රාර් (බ.ප.)
4. ලේකම්, සමුපකාර සේවක කොමිෂන් සභාව - දැ.ගැ.
5. සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් ...